# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/21 - 2010 මාර්තු 03 වැනි බදාදා - 2010.03.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (2) වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කොළඹ මහ නගර සභාවේ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභිකවරුන් විසින් කටයුතු කිරීමේ දී ඉහත කී ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඉහත කී නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභිකවරුන්ගේ ඒක පුද්ගල හෝ සාමූහික වගකීම පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1575/5 හා 2008 නොවැම්බර් මස 10 වන දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ සභාවේ පරීක්ෂණ කාලය 2010 මාර්තු 01 වැනි දින සිට 2010 අප්‍රේල් මස 30 වැනි දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම් , අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන
පිළිබඳ අමාත්‍ය.

2010 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

03-599


1A - PG 001124 — 380 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.